කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024

2026 ජූලි / අගෝස්තු

මානවශාස්ත්‍ර පීඨය

**සාහිත්‍ය විචාරය**

**සංස්කෘත සාහිත්‍ය විචාරයේ ප්‍රභවය, ඡන්දස් හා සිංහල විචාර සම්ප්‍රදාය**

**LTCR 18224**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් තෝරාගෙන
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## I කොටස

01. ඡන්දස යන්න හඳුන්වා, සිංහල ඡන්දෝග්‍රන්ථ පිළිබඳ විමසීමක් කරන්න.

02. "යවහන් ලකුණු එළි - සැතපුම් ද දනු අතුරේ
ඉටු ඇ සද පියවි හා - කිරියත් පද ද හඳුනවු"

සුදුසු පරිදි නිදසුන් දක්වමින් උක්ත පද්‍යය විවරණය කරන්න.

03. එලු සඳැස් ලකුණේ දැක්වෙන සිවුපද සඳැස් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

## II කොටස

04. සංස්කෘත කාව්‍ය විචාරවාදවල සම්භවය සිදු වූ ආකාරය සාකච්ඡා කරන්න.

05. ස්ථායීභාව ප්‍රබෝධ වීම කෙරෙහි විභාවයන්ගේ බලපෑම විග්‍රහ කොට, රස ජනනය සඳහා එයින් ලැබෙන පිටුබලය න්‍යායාත්මකව විග්‍රහ කරන්න.

06. ප්‍රේක්ෂක මනසෙහි රස නිෂ්පත්තිය සිදු වීම කෙරෙහි චතුර් අභිනය බලපාන්නේ කෙසේ ද යන්න සනිදර්ශනව විභාග කරන්න.

## III කොටස

07. "කාව්‍ය ශෝභාව ඇති කරන ධර්මතා අලංකාර නම් වේ." විමර්ශනය කරන්න.

08. කාව්‍ය විචාර ග්‍රන්ථයක් වශයෙන් සියබස්ලකරෙහි ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

09. "සිදත් සඟරාව ව්‍යාකරණ ග්‍රන්ථයක් පමණක් නොව කාව්‍යකරණයට අදාළ විවිධ ශාස්ත්‍ර සම්බන්ධව සාකච්ඡා කරන මූලාශ්‍රයයකි." සාධක සහිතව පරීක්ෂා කරන්න.

10. නූතන සිංහල කාව්‍ය නිර්මාණ, භරත මුනිගේ රස සූත්‍රය ඇසුරෙන් විචාරය කිරීම කෙතෙක් දුරට යුක්තියුක්ත දැයි නිදසුන් ඇසුරින් පහදන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*******************************